# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ     அதிவிசேஷமானது     EXTRAORDINARY

අංක 909/13 – 1996 පෙබරවාරි 09 වැනි සිකුරාදා – 1996.02.09

909/13 ஆம் இலக்கம் – 1996 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 09 ஆம் திகதி வெள்ளிக்கிழமை

**No. 909/13 - FRIDAY, FEBRUARY 09, 1996**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)   (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)   (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. –බී. 21/78 IV

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වන වගන්තිය සමග කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1996 පෙබරවාරි මස 08 වන දින,
කොළඹ දී ය.

**නියමාවලිය**

1. මේ නියමාවලිය 1996 අංක 1 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1996 පෙබරවාරි මස 12 වන දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

2. මේ නියමාවලිය, (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අදාළ වන්නේය.

3. (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට මේ ආයතනය අනුයුක්ත කරනු ලැබිය යුතුය.

4. පනතේ සහ යම් උචිත පාලක පනතක විධිවිධානවලට සහ කොමිෂන් සභාවේ බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට යටත්ව, පහත දැක්වෙන කටයුතු කිරීමට ආයතනයට බලය ඇත්තේය :–

(අ) සිසුන් ඇතුළු කර ගැනීම ;

(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීම, පුහුණුව සහ පර්යේෂණ සඳහා කටයුතු සැලැස්වීම ;

(ඇ) විවිධ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවලින් ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා කවරේදැයි, විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව තීරණය කිරීම ;

(ඌ) විවිධ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් තීරණය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව පශ්චාත් උපාධි සඳහා විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සාමාර්ථය ලබා ගැනීමෙන් ද, ආයතනය විමසීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් පනවනු ලැබූ වෙනත් කොන්දේසි සපුරා ලීමෙන් ද, විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, අභිඥාණ පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම

(ඍ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට පිහිටි වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග, ආචාර්යවරුන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඎ) ආයතනයට ඇතුළුවීමට අපේක්ෂා කරන තැනැත්තන් විසින් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විසින් හෝ වෙනත් විශ්වවිද්‍යාලවල දී නැතහොත් විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපන ආයතනවල දී සමත් වී ඇති විභාග සහ ගතකොට ඇති අධ්‍යයන කාලපරිච්ඡේද හෝ ලබන ලද ඉගෙනුම, අතුරු ව්‍යවස්ථා මගින් නියම කොට ඇති ආකාරයට ආයතනයේ එවැනි විභාගවලට සහ අධ්‍යයන කාලපරිච්ඡේදවලට හෝ ඉගෙනුමට නැතහොත් ඉන් කොටසකට සමාන ලෙස පිළිගනු ලැබීම සඳහා විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ එවැනි පිළිගැනීමක් කවර වුවද අවස්ථාවක දී ඉවත් කිරීම සඳහා නිර්දේශ කිරීම ;

(ඏ) ආයතනයේ කාර්ය සඳහා ඉගැන්වීමේ, පුහුණු කිරීමේ හෝ පර්යේෂණ කටයුතු උදෙසා පුස්තකාල, රසායනාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඐ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි මහාචාර්යධුර, සහාය මහාචාර්යධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධුර, කථිකාචාර්යධුර සහ වෙනත් තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම ;

(ඒ) පර්යේෂණ සහ පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් විශ්වවිද්‍යාලයෙන් සහ ආයතනයෙන් බාහිර ස්ථානවල පැවැත්වීමට කටයුතු, ඒ සඳහා විධිවිධාන සලස්වා ඇති යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව, පිළියෙල කිරීම ;

(ඔ) ආචාර්යවරුන්, පරීක්ෂකවරුන් සහ පර්යේෂණ අධීක්ෂකවරුන් වශයෙන් පත්කිරීමට ආයතනය විසින් අනුමත කරනු ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව පත්කිරීම ;

(ඕ) ගාස්තු ඉල්ලා සිටීම සහ භාර ගැනීම සඳහා විධිවිධාන සලස්වා ඇති යම් රීතියක් අනුව ගාස්තු ඉල්ලා සිටීම සහ භාර ගැනීම ; සහ

(ක) ආයතනයේ බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහිලා අවශ්‍යවන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

5. පහත සඳහන් තැනැත්තන් ආයතනයේ නිලධරයෝ වන්නාහ :-

(අ) අධ්‍යක්ෂවරයා ; සහ

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධරයන්.

6. (1) මේ නියමාවලිය බලාත්මකවීම ආරම්භ වූ විට කොමිෂන් සභාව විසින් ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා පත්කරනු ලැබිය යුතුය. ඉන් පසු පත්වන සෑම අධ්‍යක්ෂවරයෙකු, ආයතනයේ කළමනාකාර මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත වන මූල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතුය .

එසේ වුවද, කිසිම තැනැත්තෙකු අනුක්‍රමික ධුර කාල දෙකකට වැඩි ගණනකට ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරනු නොලැබිය යුතුය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරනු ලැබූ අවස්ථාවක, එසේ පත්කරනු ලැබූ ඒ කාර්ය මණ්ඩලයේ සාමාජිකයා, මෙම ආයතනයේ අධ්‍යක්ෂ තනතුර භාරගැනීම සඳහා ඒ ආයතනය විසින් මුදාහැරිය යුතුය.

(3) අධ්‍යක්ෂවරයා කලින් ධුරය අතහැර ගියහොත් මිස හෝ (4) වන අනුච්ඡේදය යටතේ ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැටපස්වන විය සම්පූර්ණවීම යන මේ අවස්ථාවලින් පළමුවෙන් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දරන්නේය.

(4) ද්වේෂාරෝපන යෝජනාවක් සම්මත කරගැනීම සඳහා කැඳවනු ලැබූ ආයතනයේ කළමනාකාර මණ්ඩලයේ විශේෂ රැස්වීමකදී, ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කරගනු ලැබූ ද්වේෂාරෝපන යෝජනාවක් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතුය. එවැනි විශේෂ රැස්වීමක මූලාසන දැරීම සඳහා, එම විශේෂ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින්, අධ්‍යක්ෂ නොවන යම් සාමාජිකයෙකු තෝරා පත්කරගත යුතුය.

(5) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයා, එසේ අධ්‍යක්ෂ වශයෙන් තමා පත්කරනු ලැබීමට පෙරාතුවම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටියේ නම් සහ ඔහු හැටපස්වන විය සම්පූර්ණකොට නොමැති නම්, උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරළා පැමිණිය හැකිය.

(6) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටුකිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් එසේ කාර්ය ඉටුකිරීමට නොහැකි වූ විට කොමිෂන් සභාව විසින් යෙදිය යුතුය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා ක්‍රම චර්යා කාර්ය කරගෙන යා යුතුය.

(7) අධ්‍යක්ෂ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇතිවීමෙන් පසු (1)වන අනුඡේදය යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබන තුරු ඒ ධූරයේ කටයුතු කරගෙන යාමට සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතුය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් ඒ ධූරයේ එදිනෙද කුම චර්යා කාර්ය කරගෙන යා යුතුය.

7. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණකාල නිලධරයෙකු වන අතර, ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද, වන්නේය. ඔහු කළමනාකාර මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකු හා සභාපති වන අතර, ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයක නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් ද වන්නේය. ආයතනයේ වෙන යම් බල මණ්ඩලයක හෝ මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට, එවැනි රැස්වීමකට පැමිණ සිටීමට හා එය ඇමතීමට ද ඔහුට හිමිකම් ඇති නමුදු, ඔහු ඒ බලමණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයෙකු වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේය.

(2) කළමනාකාර මණ්ඩලය විසින් තත් කාර්ය සම්බන්ධයෙන් කලින් කල තමා වෙත නිත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධිවිධාන වලට අනුකූලව, ආයතනයට අදාළ වන තාක් දුරට මේ නියමාවලියේ හා යම් උචිත සාධන පත්‍රයක ඇති විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය. ඒ කාර්යය සඳහා අවශ්‍යයයි ඔහු විසින් සලකනු ලබන සියළු බලතල ඔහුට ඇති අතර, ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(3) කළමනාකාර මණ්ඩලයේ සහ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන් දීමේ නිලධරයා වන්නේය.

(5) ආයතනය තුළ විනය පවත්වා ගැනීම ගැන අධ්‍යක්ෂවරයා වගකිය යුතුය.

8. පහත දැක්වෙන බල මණ්ඩල, ආයතනයේ බල මණ්ඩල වන්නේය :-

(අ) කළමණාකාර මණ්ඩලය ;

(ආ) අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල ; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් මණ්ඩල.

9. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරන මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේය :-

(1) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම්,

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඇ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඈ) විද්‍යා හා තාක්ෂණ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඉ) 1981 අංක 55 දරන පනතින් පිහිටුවන ලද මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ඊ) 1995 අංක 15 දරන (164 වන අධිකාරිය වූ) පනතින් පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(උ) 1981 අංක 78 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඌ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතින් පිහිටුවන ලද භූ සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(එ) 1980 අංක 47 දරන පනතින් පිහිටුවන ලද මධ්‍යම පාරිසරික අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඒ) 1981 අංක 54 දරන පනතින් පිහිටුවන ලද ජාතික ජලසම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඔ) 1985 අංක 28 දරන පනතින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඕ) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ක) ශ්‍රී ලංකා වානිජ හා කාර්මික මණ්ඩල සංගමයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඛ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල විද්‍යා පීඨවල පීඨාධිපතිවරු හෝ ඔවුන්ගේ නාමිකයන් ; සහ

(2) පහත දැක්වෙන වෙනත් සාමාජිකයන්ගෙන්, එනම්, -

(අ) එක් එක් අධ්‍යයන මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කරනු ලැබූ එක් සාමාජිකයෙක් ;

(ආ) අධ්‍යාපන, වෘත්තීය, විද්‍යා, කාර්මික සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවයක් ඉටුකර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙක්.

10. (1) අධ්‍යක්ෂවරයා කළමනාකාර මණ්ඩලයේ සභාපති විය යුතු අතර, ඔහු එහි සියළුම රැස්වීම් වල මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීමට තෝරා පත්කර ගත යුතුය.

(2) තෝරා පත්කරගනු ලැබූ හෝ පත්කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයෙක්, ඔහු කලින් ධූරය හිස් කළහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු පත්කරගනු ලැබූ දින සිට හෝ තෝරා පත්කරගනු ලැබූ දින සිට ගණන් බලනු ලබන තුන් වර්ෂයක කාලයක් ධූරය දරන අතර, නැවත තෝරා පත්කරගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේය.

එසේ වුවද, යම් තෝරා පත්කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයෙකු තම ධූර කාලය ඉකුත්වීමට පෙර තම ධූරය හිස් කළහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා, තමාද කලින් ධූරය හිස් කළහොත් මිස ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවෙන්ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දරන්නේය.

එසේම තවදුරටත්, තෝරා පත්කර ගන්නා ලද එක් එක් සාමාජිකයා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත්කරගනු ලැබුයේ යම් අධ්‍යයන මණ්ඩලයක් විසින් ද, ඔහු ඒ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකත්වය දරන තාක් පමණක් ඔහු මණ්ඩලයේ සාමාජික ධූරය දරන්නේය.

(3) මණ්ඩලයට තෝරා පත්කරගනු ලැබූ යම් සාමාජිකයකු විසින්, තම අත්සන යටතේ අධ්‍යක්ෂ වෙත යවනු ලබන ලිපියක් මගින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) මණ්ඩලයට පත්කරනු ලැබූ සාමාජිකයකු, තම අත්සන යටතේ කොමිෂන් සභාවේ සභාපතිවරයාට යවනු ලබන ලිපියක් මගින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) මණ්ඩලයේ යම් පත්කරනු ලැබූ සාමාජිකයකු, කලින් අවසර ලබා නොගෙන, මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධූරය අතහැර ගියා සේ සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීමට කොමිෂන් සභාව විසින් 9(2)(ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් තැනැත්තකු පත්කළ යුතුය.

(6) මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතුය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා අවශ්‍යය ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(8) අවශ්‍ය වන කවර වුවද අවස්ථාවක මණ්ඩලයට රැස්විය හැකි අතර, කෙසේ වුවද, වර්ෂයක දී හය වරකට නොඅඩු වාර ගණනක් මණ්ඩලය රැස්විය යුතුය.

(9) අවශ්‍යයයි තමා සලකන කවර අවස්ථාවක නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් ලැබී සතියක් ඇතුළත, අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය.

11.(1) පනතෙහි හා යම් උචිත සාධක පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය කළමනාකරණ මණ්ඩලය සතු වන්නේය.

(2) (1) වන අනුච්ඡේදයෙන් මණ්ඩලය වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය, මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය :-

(අ) විශ්වවිද්‍යාලයේ විධානවලට යටත්ව, ආයතනයේ දේපළ සහ අරමුදල් දැරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ආ) ආයතනයට සම්බන්ධ සියළු කාරණා, පනතෙහි හා යම් උචිත සාධක පත්‍රයක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(ඇ) නිශ්චිත කාර්යයන් සඳහා ආයතනයට සුදුස්සක් කර ගැනීමට සපයන ලද අරමුදල් පරිපාලනය කිරීම ;

(ඈ) අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හෝ වෙනත් ප්‍රදාන මගින් ආයතනය වෙත පවරනු ලබන දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම හා පිළිගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ ඒ වාර්තාව සහ ගිණුම් විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(උ) විවිධ විද්‍යා අංශයන්හි ලා ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ අනෙකුත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳවත්, එවැනි උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ ශාස්ත්‍රීය විශිෂ්ඨතාවලට සුදුස්සන් වීමේ අභිලාශය ඇති ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, ලැබිය යුතු පුහුණුව, සාමාර්ථය ලැබිය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත් අදාළ අධ්‍යයන මණ්ඩල හෝ මණ්ඩලය විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සාද ඒ අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා ඒ කෙටුම්පත් විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම .

(එ) රීති සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සඳහා රීති සෑදීම සහ ඒ රීති පැනවීම සඳහා ඒ රීතිවල කෙටුම්පත්, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ පාලක සභාවට හෝ සතාතන සභාවට ඉදිරිපත් කිරීම ;

(ඒ) ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහ භාණ්ඩ, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඔ) (i) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍යවන මහාචාර්යධූර, සහාය මහාචාර්යධූර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධූර, කථිකාචාර්යධූර හා වෙනත් යම් තනතුරු ඇති කිරීම සහ ඒ මහාචාර්යධූර, සහාය මහාචාර්යධූර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධූර, කථිකාචාර්යධූර සහ වෙනත් තනතුරු අහෝසි කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් ; සහ

(ii) ආයතනයට පත්කරනු ලැබිය යුතු ආචාර්යවරුන්ගේ, නිලධරයන්ගේ සහ වෙනත් සේවකයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඕ) ආයතනයෙහි සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ගේ සේවය තාවකාලිකව අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ වෙනත් ආකාරයකින් ඔවුන්ට දඬුවම් කිරීම පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ක) ආයතනයේ ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස පිළිගැනීමට සුදුසු සේ සලකනු ලබන තැනැත්තන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ග) අදාළ අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසු සහ විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව –

(i) පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අළුත් අධ්‍යයන මණ්ඩල සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ii) විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයන් අදාළ අධ්‍යයන මණ්ඩලවලට පැවරීම පිළිබඳව කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ජ) මණ්ඩලයට සුදුසු යයි පෙනීයන ප්‍රමාණයක ස්ථාවර කමිටු හෝ තන් කාර්ය කමිටු පත්කිරීම, ඒවායේ විෂය කරුණු නියම කිරීම සහ ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම ඇතිව හෝ නැතිව, ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ; සහ

(ට) පාඨමාලාවට සිසුන් ඇතුළත් කරගැනීම සඳහා වූ නියමයන් අදාළ අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල විමසා සහ විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, නිශ්චය කිරීම.

12. පහත දැක්වෙන එක් එක් විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සහ මණ්ඩලයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් එක් එක් විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එක් අධ්‍යයන මණ්ඩලයක් බැගින්, ආයතනය විසින් ප්‍රතිෂ්ඨාපිත කළ යුතුය :–

(අ) ජීව රසායනය සහ අණුක ජීව විද්‍යාව ;
(ආ) රසායනික විද්‍යා ;
(ඇ) භූමික විද්‍යා ;
(ඈ) පාරිසරික විද්‍යා ;
(ඉ) ගණිතය ;
(ඊ) භෞතික විද්‍යාව ;
(උ) ශාක විද්‍යා ;
(ඌ) විද්‍යා අධ්‍යාපනය ;
(එ) සංඛ්‍යා ලේඛන හා පරිගණක විද්‍යාව ; සහ
(ඒ) සත්ත්ව විද්‍යාව.

13. (1) එක් එක් අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :–

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ අදාළ අධ්‍යයන අංශයේ ප්‍රධානියා ;
(ඇ) අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුමක් ලබාගෙන සිටින්නාවූ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන් අතුරෙන් විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත මණ්ඩලය විසින් පත්කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙක් ; සහ
(ඈ) අදාළ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය පිළිබඳ විශිෂ්ටත්වයක් ලබා සිටින තැනැත්තන් අතුරෙන් කළමණාකාර මණ්ඩලය විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

(2) යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චිත කාලයකට එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, කවර වුවද අධ්‍යයන මණ්ඩලයක් විසින් එහි සාමාජිකයකු ලෙස ඊට එකතු කරගනු ලැබිය හැකිය. එහෙත් එසේ එකතු කරගනු ලැබූ කවර වුවද තැනැත්තකුට, ඒ අධ්‍යයන මණ්ඩලයට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත්වීමේ හෝ ඒ මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දයදීමේ හෝ අයිතියක් නැත්තේය.

(3) (අ) පත්කරනු ලැබූ යම් සාමාජිකයෙක්, කලින් තම ධූරය හිස් කළහොත් මිස, ඔහු පත්කරනු ලැබූ දින සිට ගණන්බලනු ලබන තුන් අවුරුදු කාලයක් තම ධූරය දැරිය යුතු අතර, නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේය.

එසේ වුවද පත්කරනු ලැබූ යම් සාමාජිකයකු, තම ධූර කාලය ඉකුත්වීමට පෙර තම ධූරය හිස් කළහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, කලින් තම ධූරයෙන් ඉවත්ව ගියහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති ධූර කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

(ආ) තම අත්සන යටතේ අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ලිපියක් මගින්, අධ්‍යයන මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු විසින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(ඇ) නිවාඩු ලබා නොගෙන අධ්‍යයන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හරින අධ්‍යයන මණ්ඩලයේ පත්කළ යම් සාමාජිකයකු අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම ධූරය හැර ගියා සේ සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීමට සුදුසු තැනැත්තකු මේ නියෝගයේ (1) වන ඡේදයේ (ඇ) අනුඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය.

(4) එක් එක් අධ්‍යයන මණ්ඩලය සඳහා සභාපතිවරයකු සිටිය යුතු අතර ඒ සභාපතිවරයා ඒ අධ්‍යයන මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුය.

(5) එක් එක් අධ්‍යයන මණ්ඩලය සඳහා ලේකම්වරයකු සිටිය යුතු අතර, ඒ ලේකම්වරයා ඒ අධ්‍යයන මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත්කරගනු ලැබිය යුතුය.

(6) යම් අධ්‍යයන මණ්ඩලයක යම් රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය, එකතුකර ගත් සාමාජිකයින් කිසිවකු වෙත් නම් ඔවුන් අතහැර, සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් සමන්විත වන්නේය.

(7) එක් එක් අධ්‍යයන මණ්ඩලයක් අවශ්‍ය කවර හෝ විටක රැස්විය යුතු අතර, කෙසේ වුවද, එක් වර්ෂයක් තුළ දී හය වරකට නොඅඩු වාර ගණනක් එවැනි මණ්ඩලයක් රැස්විය යුතුය.

14. (1) පනතෙහි සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, එක් එක් අධ්‍යයන මණ්ඩලයකට, අදාළ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයට සම්බන්ධ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය ඒ ඒ අධ්‍යයන මණ්ඩලය සතු වන්නේය.

(2) (1) වන අනු ඡේදයෙන් එක් එක් අධ්‍යයන මණ්ඩලයක් වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, එක් එක් අධ්‍යයන මණ්ඩලයක් විසින්, අදාළ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයට සම්බන්ධ පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කළ යුතුය :–

(අ) මණ්ඩලය විසින් තමන් වෙත යොමුකරන ලද කවර කරුණක් හෝ පිළිබඳව සලකා බලා වාර්තා කිරීම ;
(ආ) අදාළ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන හෝ සටහන් හා විභාග ආදිය සම්බන්ධව වූ සියළු කාරණා ගැන නිර්දේශ හා වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;
(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්ය සඳහා, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත්කිරීම ;
(ඈ) අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට විෂයයන් ඇතුල් කරවා ගැනීම සඳහා තිබිය යුතු අවශ්‍යතා මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;
(ඉ) ආචාර්යවරයන් සහ විභාග පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීම සඳහා සලකා බැලීමට සුදුසු තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;
(ඊ) අදාළ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයට නියමිත විභාග සමත්වීමෙන් හා වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් එම අංශයට අදාළ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති පුද්ගලයන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(උ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා තරග කිරීමේ ක්‍රමය හා කොන්දේසි මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඌ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සුදුසු පුද්ගලයන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ; සහ

(එ) (i) පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අළුත් අධ්‍යයන මණ්ඩල සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ
(ii) විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයන් අදාළ අධ්‍යයන මණ්ඩලවලට පැවරීම පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

15.(1) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි විශ්වවිද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනය විසින් පත්කරනු ලබන නිලධරයන්ගෙන්, ආචාර්යවරයන්ගෙන් සහ වෙනත් සේවකයන්ගෙන්, ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතුය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් මුද හැරීමෙන් හෝ කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලය විසින් පත් කිරීමෙන් හෝ ලබාදිය යුතුය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාල පදනමක් මත මුදහැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරට හිමි වේතනය හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතුය. අනෙකුත් අවස්ථාවක විශ්වවිද්‍යාලය විමසීමෙන් පසු කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ආයතනය විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් අදාළ නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවකයාට ගෙවිය හැකිය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂවරයාගේ විධානවලට හා විනය පාලනයට යටත් විය යුතුය.

16. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂයම වන්නේය.

17.(1) (මෙහි මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යා පශ්චාත් උපාධි ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ආයතනයට තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතුය :-

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව ආයතනයට ගෙවිය යුතු ගාස්තු ;

(ආ) පරිත්‍යාගවලින් ලබන ආදායම් ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලදුව, කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර මුදල් වශයෙන් වෙන් කරනු ලබන්නා වූ මුදල් , සහ

(ඈ) කවර ප්‍රභවයකින් හෝ අත්කරගනු ලැබ ආයතනයට උපචිත වන්නා වූ වෙනත් සියළු මුදල්.

(2) යම්කිසි මාසයක් තුළ දී අරමුදලට ගෙවූන ලැබූ සියළු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සාරාංශයක්, උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ගකර, ඊළඟ ඉදිරි මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවට දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

18. (අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති පිළිවෙලට හා ආකාරයට ආයතනයේ ගණන් තැබීම ;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියළු මුදල් භාරගැනීම සහ ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂයන්ට බැර කිරීම .

(ඇ) බලය දෙනු ලැබූ සියළු ගෙවීම් කිරීම ; සහ

(ඈ) කොමිෂන් සභාවට අවශ්‍ය ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික විසර්ජන, මණ්ඩලය සඳහා පිළියෙල කිරීම

අධ්‍යක්ෂවරයාගේ කාර්ය වන්නේය :

එසේ වුවද, ආයතනයේ ගිණුම්වල නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රතිපාදන වලින් හෝ නිශ්චිත අරමුණු සඳහා පරිත්‍යාග වලින් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පෙන්නුම් කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රතිපාදන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහාද, ඒ කාර්ය හෝ අරමුණු නොවන කරුණු සඳහා ඒ ආදායමින් කිසිදු ගෙවීමක් නොකළ යුතුය.

19. (1) කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන පිළිවෙලට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගණන් හා සංඛ්‍යාලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කළ යුතුය.

(2) ආයතනයේ ගණන් පොත් ආයතනයෙහි කාර්යාලයෙහි තැබිය යුතුය.

20. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තෙකු යථා පරිදි තෝරා පත්කරගනු ලැබී ද, පත් කරනු ලැබී ද, නම් කරනු ලැබී ද, අතිරේකව යොදනු ලැබී ද, නැතහොත් ඔහු ඒ බලමණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටීමට හිමිකම් ලබා තිබේ ද යන්න ගැන යම් සැකයක් පැන නැගුනහොත්, ඒ කාරණය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේය.

21. ආයතනයට අදාළ යම් කාර්යයක් සම්බන්ධයෙන් මේ නියමාවලිය යටතේ විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක දී, පනතේ ඊට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඒ කාරණයට සහ ඒ කාරණය සම්බන්ධයෙන් අදාළ කරගත යුතුය.

22. මේ නියමාවලියේ –

''උචිත සාධන පත්‍රය'' යන්නෙන්, ඉහත සඳහන් පනතේ විධිවිධානවලට අනුකූලව සාදනු ලැබූ යම් නියමයක්, නියමාවලියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

''විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය'' යන්නෙන්, රසායන විද්‍යා, භූමික විද්‍යා, පාරිසරික විද්‍යාව, ශාක විද්‍යා, සත්ව විද්‍යා, ජීවරසායන සහ අණුක ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය, විද්‍යා අධ්‍යාපනය, සංඛ්‍යා ලේඛනය සහ පරිගණක විද්‍යාව හෝ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් කවර වුවද විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් වේ.

02-675/1